# සාමාන්‍ය සමයේ විසි එක් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය — යෙසායා 22: 15, 19–23

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

දාවිත්ගේ වංශයේ තිල යතුරු ඔහුට දෙනු ලබන්නේ ය.

සියලු බලැති දෙවි ස්වාමීන් වහන්සේ මට කතා කොට, "රාජගෘහාධිකාරී ෂෙබ්නා වෙත ගොස් මෙසේ කියන්න, මට නියම කළ සේක" යි දන්වන්න. "සමිඳාණන් වහන්සේ තුඹේ තිලයෙන් තුඹ පහ කර, තුඹේ උසස් තත්වයෙන් තුඹ පහතට හෙළා දමන සේක."

සමිඳාණන් වහන්සේ ෂෙබ්නාට මෙසේ වදාළ සේක. "එසේ සිදු වූ විට හිල්කියාගේ පුත්‍ර වූ මාගේ මෙහෙකරු වන එලියාකිම්ට මම අඬ ගසන්නෙමි. තුඹේ තිල සළුව ඔහුට හඳවා, තුඹේ පටිය ඔහුගේ ඉඟටියේ බැඳ තුඹේ ආධිපත්‍යය මම ඔහුට පවරා දෙමි. ඔහු ජෙරුසලමේ සෙනඟටත්, ජුදාවේ වංශයටත් පියෙකු මෙන් වනු ඇත. දාවිත්ගේ වංශයේ තිල යතුරු ඔහුට දෙනු ලබන්නේ ය. ඔහු අරින දේ කිසිවෙක් නොවසන්නේ ය. ඔහු වසන දේ කිසිවෙක් නාරින්නේ ය. මම සවි කළ ඇණයක් මෙන් ඔහු සිය තනතුරෙහි තිරසර ලෙස පිහිටුවන්නෙමි. ඔහුගේ මුළු වංශයට ඔහු ගෞරවයක් වන්නේ ය".

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 138: 1–3, 6, 8

පිළිතුර : සමිඳුනි, ඔබවහන්සේගේ ප්‍රේමය සදා පවත්නේ ය.

ගීය : සමිඳුනි, හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි.
දෙව්වරුන් ඉදිරියෙහි ඔබට ගී ගයා ඔබ පසසන්නෙමි.
ඔබේ ශුද්ධ මාළිගාව දෙස බලා නමස්කාර කරමින්
ඔබේ විශ්වාසවන්ත භාවය නිසා
ඔබේ නාමයට තුති පුදන්නෙමි.

ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව
ඔබ පෙන්වූ සේක.
මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක;
මාගේ සිත සවි කොට මට ධෛර්යය දුන් සේක.

සමිඳාණෝ උසස් නමුත් පහත් අය සලකන සේක.
එහෙත්, උඩගු අය දුර සිට ම හැඳින ගන්න සේක.
සමිඳාණෝ මා සම්බන්ධ ව අදහස් කරන දේ ඉටු කරන සේක.
සමිඳුනි, ඔබේ ප්‍රේමය සදා පවත්නේ ය.
ඔබ ඇරඹූ වා වූ දේ නිම කළ මැනව.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 11: 33-36

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### සියල්ල මවා වදාරන්නේ උන් වහන්සේ ය.

දෙවියන් වහන්සේගේ වරප්‍රසාද සම්භාරය කෙතරම් විශාල ද? උන් වහන්සේගේ ප්‍රඥාව සහ ඥානය කෙතරම් ගැඹුරු ද? උන් වහන්සේගේ විනිශ්චයන් කෙතරම් අචින්ත්‍ය ද? උන් වහන්සේගේ ක්‍රියා මාර්ග කෙතරම් වර්ණනා විෂයාතික්‍රාන්ත ද? ශුද්ධ ලියවිල්ලෙහි මෙසේ කියා ඇත.

“සමිඳානන් වහන්සේගේ සිත තේරුම්ගත්තේ කවරෙක් ද? උන් වහන්සේට පුරෝහිතයා වූයේ කවරෙක් ද? උන් වහන්සේගෙන් ප්‍රතිඵලයක් ලබන පිණිස, පළමුකොට උන් වහන්සේට යමක් දුන්නේ කවරෙක් ද?” මන්ද සියල්ල මවා වදාරන්නේ උන් වහන්සේ ය; සියල්ල රක්ෂා කරන්නේ, සියල්ල අර්ථාන්විත කරන්නේ උන් වහන්සේ ය. උන් වහන්සේට සදහට ම මහිමය වේ වා! ආමෙන්.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද

මතෙව් 16: 18

ආලේලූයා! ආලේලූයා!
“මම ඔබට කියමි. ඔබ පේදුරු ය.
මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි.
පාතාලයේ දොරටුවලට වුව ද එය පරාජය නොකළ හැකි ය”යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 16: 13–20

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

ඔබ පේදුරු ය. මේ පර්වතය පිට
මාගේ සභාව ගොඩනගන්නෙමි.

ජේසුස් වහන්සේ පිලිප්පි කායිසාරියේ පෙදෙස්වලට පැමිණි කල, “මනුෂ්‍ය-පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියත් දැ”යි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසූ සේක. ඔව්හු කතා කොට, “සමහරෙක් ‘ස්නාවක ජොහන්’ය කියා ද, සමහරෙක්, ‘එලියා’ ය කියාද, අන් සමහරෙක් ‘ජෙරෙමියා නොහොත් දිවැසිවරයන්ගෙන් කෙනෙක්’ය කියාද කියති”යි කී හ. “එහෙත් ඔබ මා කවරෙකු කියා කියන්නහුදැ”යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. සීමොන් පේදුරු උත්තර දෙමින්, “ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය” යි කීය. ජේසුස් වහන්සේ උත්තර දෙමින් “ජෝනාගේ පුත් සීමොන් ඔබ ඉතා භාග්‍යවන්තය. මන්ද, ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ විසින් මිස, මනුෂ්‍ය මඟකින් මෙය ඔබට එළිදරව් නොකරන ලද්දේ ය. මම ඔබට කියමි. ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටුවලට වුව ද එය පරාජය නොකළ හැකි ය. ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද, එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය.”යි වදාළ සේක. තවද, තමන් ක්‍රිස්තුන් වහන්සේ බව කිසිවකුට නොකියන ලෙස උන් වහන්සේ ශ්‍රාවකයන්ට අණ දුන් සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*